**ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය- 2020**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ ("සංගමය") 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංගමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ජාතික තරඟාවලි වියදම් අගයෙන් රු 774,000.ක් වූ අනුග්‍රාහක ආදායම අඩුකර ඉතිරි අගය වූ රු 637,000.ක් තරඟාවලි වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් අනුග්‍රාහක ආදායම් සහ තරඟාවලි වියදම් රු 774,000.ක් බැගින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | රුපියල් 1,411,000 ක් වූ ඉන්වොයිසිය තුල ඇතුළත් වී ඇති රුපියල් 774,000 ක වට්ටම අඩුකර රුපියල් 637,000 ක් වූ ශුද්ධ වියදම ගිණුම් ගතකර ඇත. මෙම මිල වට්ටම සාකච්ජා කර ලබා ගත් මිල කේවල් කිරීමක් මිස අනුග්‍රාහකත්වයක් නොවේ. | සංගමය වෙත ලබාගත් අනුග්‍රාහක ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | ශේෂ පිරික්සුමේ සහ ප්‍රධාන ලෙජරයේ ගොඩනැගිලි අළුත්වැඩියා හා නඩත්තු ගිණුමේ අගය රු 2,646,953.ක් වුවත් මෙම අගය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ පරිපාලන වියදම යටතේ රු 3,356,953.ලෙස දක්වා තිබුණිකාශනවල ප්‍රජ් අනුව මූල්‍ය . 710,000.මෙම වියදම රුක් වැඩියෙන් දක්වා තිබුණි . | ගොඩනැගිලි සහ නඩත්තු වියදම් රු. 2,646,953.00 කි. කෙසේ වෙතත් සනීපාරක්ෂක වියදම් රු. 538,517.07 මේට්ලන්ඩ් පෙදෙසෙහි පිහිටි ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ කාර්යාල වියදම රු.138,983 නව බැඩ්මින්ටන් සංගම් පරිශ්‍රය විවෘත කිරීම් වියදම් රු.32,500 යන වියදම් 2020 වසරේ ගොඩනැගිලි හා නඩත්තු වියදම් යටතේ ඇතුලත් කර ඇත. කෙසේ වෙතත්, මෙම වියදම් 2021 ගිණුම්වල කාර්යාල වියදම් යටතේ වෙන් වෙන්ව දක්වමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

**1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම්වල ඇතුළත් රු 4,332,620.ක් වූ ලැබිය යුතු ගිණුම් 06 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2021 පෙබරවාරි මසදී මහා සභා අනුමැතිය ලැබීමෙන් පසු මෙම ලැබිය යුතු ශේෂ 2021 දී කපා හරින ලදී. හිටපු ජාතික පුහුණුකරු වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,687,335 ක මුදල් ප්‍රතිපූරණය කරන ලෙස සිහි කැඳවීම් කිහිපයක් අමාත්‍යාංශයට යවා ඇත. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.2 ගෙවිය යුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂයේදී 2019සංගමය විසින් ක්‍රීඩකයින් න්තර දෙනෙකු ජාත්‍ය 04 ඩා තරඟවලට සහභාගි වීමක්‍රී වෙනුවෙන් සංගමයේ හිටපු සභාපතිවරයා විසින් වැයකරන ලද රු 1,200,000.ක් වූ ගුවන් ටිකට්පත් හා යැපීම් දීමනා හිටපු සභාපති වෙත ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි මෙම . අගය Badminton Asia ආයතනයෙන් ප්‍රතිපූරණය කරගත යුතු වුවත් එම ආයතනයෙන් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල කෙටි කාලයක් තුළ ආසියානු බැඩ්මින්ටන් ආයතනයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට බලාපොරොත්තු වේ. | සංගමය විසින් ගෙවිය යුතු වියදම් අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ව්‍යවස්ථාවේ 10වන පරිච්ඡේදයේ )b) වගන්තිය | විධායක කමිටු රැස්වීම් මාසයකට වරක් පැවැත්විය යුතු වුවත් වර්ෂයේ මාස 2020 ක් සඳහා විධායක කමිටු 06 .රැස්වීම් පවත්වා නොතිබුණි | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් රැස්වීම් කිහිපයක් නොපැවැත්විණි. | විධායක කමිටු රැස්වීම් ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,662,097 ක අතිරික්තයක් වූ අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,473,197 ක් විය. ඒ අනුව මූල්‍යා ප්‍රතිඵලයෙහි රු. 16,135,294 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආදායම රු. 14,536,430 කින් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය වෙත රු 32,642,424.ක් අනුග්‍රාහක ආදායම් පුද්ගලික සමාගමක් මගින් ලබාදී තිබුණු අතර එම අනුග්‍රාහක මුදල් ලබා ගැනීම වෙනුවෙන් ප්‍රචාරණය කල යුතු අනුග්‍රාහක දැන්වීම් ප්‍රමාණයසම්බන්ධයෙන් , හක ආයතනය සමග සංගමය සහ අනුග්‍රා ගිවිසුම් වලට එළඹ නොතිබුණි. | ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයට අනුග්‍රාහකයන් සමඟ දැනට පවතින ගිවිසුමක් නැත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයට වලංගු අනුග්‍රාහකයන් අවශ්‍ය වේ. | සංගමය වෙත ලැබෙන පහසුකම් සහ සංගමය විසින් ලබාදෙන පහසුකම් ඇතුලත් වන පරිදි අනුග්‍රාහක ආයතනය සමග නිවැරදි ලෙස ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංගමය විසින් මාස ක කාලයක් 06 දෙනෙකු 06 සඳහා පුහුණුකරුවන් බඳවා ගෙන තිබුණු අතර එයින් දෙනෙකුගේ 05 පුහුණුකරුවන් කින් දීර්ඝ කර 04 සේවා කාලය මාස .තිබුණිඉතිරි පුහුණුකරුවන් දෙදෙනෙකු මාස ක කාලයක් 05 සඳහා බඳවා ගෙන තිබුණි. මෙම පුහුණුකරුවන් සඳහා දීමනා ලෙස රු 2,931,602.ක් වර්ෂයේදී 2020 .ගෙවා තිබුණි<br>මෙම පුහුණුකරුවන් හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනිමේදී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර , බඳවා ගත් පුහුණුකරුවන්ගේ කාර්ය මවේදයක් සාධනය ඇගයිමේ ක්‍ර | පුහුණුකරුවන්ගේ කාර්ය සාධනය, පැමිණීම සහ පුහුණු ඵලදායිතාව මාසික පදනමින් අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයට ක්‍රියා පටිපාටියක් ඇත. මෙම ඇගයීම ජාතික සංචිත පුහුණු කමිටුවේ සභාපති විසින් පවත්වනු ලබන අතර ඔහුගේ අනුමැතියෙන් පසු මාසික වැටුප නිකුත් කරනු ලැබේ. | පුහුණුකරුවන් හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනිමේදී සහ බඳවා ගත් පුහුණුකරුවන්ගේ කාර්ය සාධනය ඇගයිමේ ලේඛනගත ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම කළ යුතු වීම. |

යාත්මක කරසංගමය විසින් ක්‍රි නොතිබුණි.

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**
---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල iii කොටස 7 xxi ප්‍රකාරව රජයේ සම්මත ප්‍රසම්පාදන ක්‍රියා පාටිපාටි අනුගමනය කල යුතු වුවද අවස්ථා 04 කදී රු.4,300,953 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. | ලැයිස්තුවට අනුව බොහෝ මිල කැඳවුම් ලැබී ඇත. අනාගතයේදී මෙය වඩාත් හොඳින් සිදු කිරීමට අපි වග බලා ගන්නෙමු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**
-----------------------------------------

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**
----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල III කොටස 7 xii ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි | ක්‍රියාකාරි සැලැස්ම අයවැය පාලන ක්‍රියාවලිය හරහා ක්‍රියාත්මක වේ. | ජාතික ක්‍රීඩා සංගම් නියෝගවලට අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වීම. |

**4.2 අයවැය පාලනය**
----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද සංගමය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2020 සඳහා අයවැය සකස් කරන ලද අතර එය සංගමයේ තත්‍ය කාර්ය සාධනය මැන බැලීමේ පදනම විය. | සමාලෝචිත වර්ෂය සඳහා වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් සකස් කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වීම. |